සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 06 - 2024**

# සිංහල භාෂාව හා සාහිත්‍යය

**කාලය පැය 02 යි**

නම / විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

(01) සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන,
i. 32 කි. ii. 54 කි. iii. 60 කි. iv. 56 කි.

(02) උක්ත නාම පදය වන්නේ,
i. ගැහැනියක ය. ii. පුතෙකු ය. iii. මා ය. iv. මිනිසා ය.

(03) ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා පදයකි,
i. ගයති. ii. ගැයුවා ය. iii. ගැයුවේ ය. iv. ගයහු.

(04) ''ගුරුතුමා දක්ෂ ශිෂ්‍යයාට ත්‍යාගය පිරිනැමුවේ ය'' යන වාක්‍යයේ කර්ම පදය කුමක් ද?
i. දක්ෂ ii. ත්‍යාගය iii. ගුරුතුමා iv. ශිෂ්‍යයාට

(05) ඇලපිල්ල හා පාපිල්ල පිළිවෙළින් යෙදුණු වචනය තෝරන්න.
i. පූසා ii. පාරුව iii. දීසිය iv. මුදුන

- අංක 6 සිට 8 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවල සමානාර්ථවත් පදය තිත් ඉර මත ලියන්න.

(06) ඉඩෝරය - ..............................................................................

(07) දිය - ..............................................................................

(08) සාගින්න - ..............................................................................

- අංක 9 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වචනවල විරුද්ධාර්ථවත් පදයක් බැගින් තිත් ඉර මත ලියන්න.

(09) දුප්පත් - ..............................................................................

(10) වක්‍ර - ..............................................................................

- අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල වගන්තියට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) මහප්‍රාණ අක්ෂර යෙදී නැති වරණය,
i. ඛ, හ, ළ ii. ඡ, ඵ, ශ iii. ඹ, ළ, ෂ iv. ණ, ධ. ඪ

(12) කෝවිල යන වචනය නිර්මාණය වීමට ස්වර ව්‍යඤ්ජන නිවැරදි ව යෙදුණු පිළිතුර,
i. ක් + උ + ව් + ඊ + ල් + අ ii. ක් + ඕ + ව් + ඉ + ල් + අ
iii. ක් + ඖ + ව් + උ + ල් + ඇ iv. ක් + ඕ + ව් + උ + ල් + අ

(13) සඤ්ඤක අක්ෂරයක් යෙදුණු වචනය,
i. ණය ii. විශේෂ iii. පඹයා iv. වළං

- අංක 14 සිට 15 තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.

(14) i. මහලු නිවාසය ii. පරීක්ශනය iii. ප්‍රචන්ඩ iv. රනරාළ

(15) i. ප්‍රථිපල ii. බයානක iii. ගංගාව iv. සංසයා

- අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(16) ........................................ (කම්කරුවා / කම්කරුවෝ) මහා මාර්ගය පිරිසිදු කළහ.

(17) දැරියක් සුරතල් ........................................ (සත්තු / සතුන්) ඇති කළාය.

(18) ගඟ නිසසලව පහළට ගලා ........................................ (බසිති / බසියි)

(19) ක්‍රීඩකයෝ සාර්ථක ව තරගය නිමා ........................................ (කළේ ය / කළෝ ය)

(20) පහත වාක්‍යය නිවැරදිව පද බෙදා, විරාම ලක්ෂණ යොදා, නැවත තිත් ඉරි මත ලියන්න.

ඇයිමෝඩයෝඔයතරම්දේකුත්නොදැනදඋඔඉබිමස්කන්න තනන්නේ

..........................................................................................................................................

(ලකුණු 2×20=40)

## II කොටස

- **ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **1, 2, 3, 4 ප්‍රශ්න සඳහා අනිවාර්යයෙන් ම පිළිතුරු සැපයිය යුතු අතර 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න.**

(1) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය කුමක් ද?

ii. පහත කවිය සම්පූර්ණ කරන්න.

සමන් නෙලුම් හා මහනෙල් ද රෝස
මලින් නැගී ආ සුවඳත් උරා බී
.........................................................
.........................................................

iii. පහත උක්ත නාම පදවල අනුක්ත රූපය ලියන්න.

(අ) ගොවියෝ -
(ආ) මිනිසා -
(ඇ) කාන්තාවෝ -
(ඈ) නාගරිකයා -

iv. ''වටු කිරිල්ලී හා තවත් කතා'' කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

v. ''මා එක් වර මැ උඩ යන්නට වන් සැටියක් හැඟිණි''
මෙම කොටස උපුටා ගන්නා ලද පාඩමේ නම ලියන්න. (ලකුණු 2 × 5 = 10)(

(2) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150ට නොඅඩු රචනාවක් ලියන්න.

i. ගැල්කරුවෙකුගේ ජීවිතය
ii. මිහිකත සුරකින තුරුලිය සුරකිමු.
iii. සරුංගලයක් කතා කරයි.
iv. අලුත් අවුරුදු උත්සවයේ වැදගත්කම
v. පොත පත කියවීමේ අගය (ලකුණු 20)

(3) දුර බැහැර සිටින ඔබගේ හොඳ ම යාළුවාගේ සුවදුක් විමසමින් ඊළඟ පාසල් නිවාඩුව ගත කිරීමට ඔබේ නිවසට පැමිණෙන ලෙස ඉල්ලමින් යාළුවාට යවන ලිපිය ලියන්න.

නැතහොත්

ඔබගේ හොඳ ම යහළුවා ජාත්‍යන්තර ළමා චිත්‍ර තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගැනීම වෙනුවෙන් ඔහුට යවන සුබ පැතුම් පත සකස් කරන්න.

(ලකුණු 10)

(4) **පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

මාළු බැම පුරාණ කුමාරවරුන් ද විනෝදාස්වාදයක් ලත් ක්‍රීඩාවක් බව, කුඩා අප ඇසූ සුරංගනා කතාවකින් ද දැන ගන්නට ලැබිණ. ''මුවන් තිස්ස කුමාරයාගේ කතාව''ලංකාවේ සෑම ගමක් පාසා පැතිර ගිය ජනප්‍රවාදයකි. එම්. පාකර් මහතා ''ලංකා ජන කතා'' නමින් ලියූ කාණ්ඩ තුනකින් යුත් ග්‍රන්ථයෙහි, එම කතාව දක්වා ඒ ඒ පළාත්වල ප්‍රචාරිත වීමෙන් එකතු වුණු වැඩි පද ද පෙන්නයි. එක එක පළාතෙහි අමුතු අමුතු වේශයන් ද අමුතු අමුතු නමින් ද ප්‍රචාරය වුවත්, ඒ කතාව හැඳින ගැනීම දුෂ්කර නොවේ. මුවන් තිස්ස කුමාරයාගේ එක් යහළු කුමාරයකුගේ නාමය අලින් තිස්ස ය. ඔහුට ඒ නම හිමි වූයේ, ඔහු අලියකු ඇමටත්, කිතුල් ගසක් බිලීපිත්තටත් ගෙන මාළු බෑ දැවැන්තයකු වූ බැවිනි.

i. පුරාණ කුමාරවරු විනෝදාස්වාදයක් ලැබූ ක්‍රීඩාව කුමක් ද?
ii. ලංකාවේ සෑම ගමකම පැතිර ගිය ජනප්‍රවාදය ලියන්න.
iii. එම්. පාකර් මහතා ලියන ලද කාණ්ඩ තුනකින් යුත් ග්‍රන්ථය කුමක් ද?
iv. මුවන් තිස්ස කුමාරයාගේ එක් යහළුවෙකුගේ නම ලියන්න.
v. එම යහළුවාට එම නම හිමිවූයේ ඇයි? (ලකුණු 2 ×5 = 10)

- **5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

(5) **පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

i. 'එක කාරණේකට නෙ මෙයි දහ කාරණේකට උණත් මම එකඟ වෙන්නම්'

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

(ආ) ජනශ්‍රැතියට අයත් අංග 2ක් ලියන්න.

ii. වැදි ජනයා පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ ලියූ විදේශීය විද්වතෙකු හා දේශීය විද්වතෙකු නම් කරන්න.

iii. (අ) ''රූකඩ කපන්නාගේ කම්මල'' උපුටා ගන්නා ලද කෘතිය කුමක් ද?

(ආ) එහි රචකයා කවුද?

iv. (අ) කුමාරතුංග මුණිදාස මහතාගේ ළමා කෘති දෙකක් නම් කරන්න.

(ආ) පන්සිය පනස් ජාතක පොත ලියැවුණු යුගය ලියන්න.

v. පහත කවිය සම්පූර්ණ කරන්න.

බතට කන්න බැරි බතලේගල කන්ද
අලට කන්න බැරි අලගල්ලේ කන්ද
..........................................................................
.......................................................................... (ලකුණු 2 × 5 = 10)

(6) **පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දේ දැයි ලියන්න.**

i. ''ඈ අප්පේ, කාට දැකුමක් ද ඔය තඩේ ගෙනියන්නේ.''

ii. ''හනික, හනික, බලා ඉන්ට කල් නෑ''

iii. ''අම්මාව එක්ක යන්නේ මම''

iv. ''බුලත් හැපියැක් ද කොටන්ඩ ද නැන්දේ.''

v. ''මා විචාරා ම කව බොව'' (ලකුණු 2 × 5 = 10)

(7) **පහත දැක්වෙන වාක්‍ය අතීත කාල ක්‍රියාපද යොදා සම්පූර්ණ කරන්න.**

i. නයනා ගී ගයමින් ....................................................

ii. ලේඛකයා ලස්සන කතාවක් ..................................

iii. ගෙවිලියෝ ගොයම් ................................................

iv. වෙළෙන්දිය ඉතුරු මුදල ........................................

v. ගුරුවරු කාර්යාලයට ............................................... (ලකුණු 2 × 5 = 10)